# ලංකාවිත්ති
LANKA VITHTHI

**LANKA VITHTHI**
**P. O. BOX 64678**
**LONDON NW3 9LS**
**E N G L A N D**

*Phone* : **020 74289388**
*Fax* : **0871 9005163**
E-mail : **lanka.viththi @ virgin.net**

*කර්තෘ* : දයා ආනන්ද රණසිංහ
***Editor*** : **Daya Ananda Ranasinghe**
*චිත්‍ර* : චන්දන සෙනෙවිරත්න
***Art*** : Chandana Seneviratna
*පරිගණක කටයුතු* : චන්න කබ්රාල්
***Computer Graphics*** : Channa Cabraal
*ඡායාරූප* : ආනන්ද කාරියවසම්
***Photography*** : Ananda Kariyawasam




## බෝම්බ, ඛණිජ තෙල් සහ බටහිර ආණ්ඩු

**1988** දෙසැම්බර් මස **21** වෙනි බදාදා දිනයේ Pan American World Airways ගුවන් සමාගමට අයත් **Pan Am Flight 103** ගුවන් යානය ලන්ඩනයේ හීත්රෝ ගුවන් තොටුපළේ සිට නිව්යෝර්ක් කෙනඩි ගුවන්තොටුපළ වෙතට යෑමට සවස 6.25 ට අහසට නැංගාය. එය හීත්රෝ සිට ස්කොට්ලන්තයට දෙසට පියඹා ගොස් මිනාඩි 35කට පසු හැන්දෑවේ 7ට ස්කොට්ලන්තයේ ලොකර්බි නම් ප්‍රදේශයට උඩින් යද්දී ගුවන්යානය තුළ කිසිවෙකු තැබූ බෝම්බයක් පිපිරියාමෙන් විනාශ වී ගියේය. එහි ගමන්ගත් මගින් **243** දෙනෙක්ද, ගුවන් නියමුවා ඇතුළු යානාවේ සේවකයින් **16** දෙනෙක් ද ලොකර්බි ප්‍රදේශයේ ස්කොට්වරු **11** දෙනෙකු ද ඇතුළු මරණ සංඛ්‍යාව **270** ක් විය.

බ්‍රිතාන්‍ය පොලිසියද, ඇමරිකාවේ **FBI** ආයතනයද එක්ව බෝම්බ පිපිරීම ගැන වහා පරීක්ෂණ ඇරඹූහ. ඉස්ලාම් මූලධර්මවාදී ත්‍රස්ත කණ්ඩායම් කිපයක් අතරින් **(Guardian of the Islamic Revolution)** නම් සංවිධානය කොටුකර ගැන්මට කටයුතු ඇරඹිණ. පිපිරුණු බෝම්බය කැසට් රෙකෝඩරයක් තුළ සවිකොට සූට්කේසයක බහා හීත්රෝ ගුවන් තොටුපලෙන් ගුවන් යානයට පටවා ඇති බවද සොයාගන්නා ලදි.

අවුරුදු **3** ක් පුරා සාක්ෂිකරුවන් **15,000** කගේ කට උත්තරද උපයෝගි කරගෙන 1991 නොවැම්බර් 13වෙනි දින **Libyan Arab Airlines** හි ආරක්ෂක අංශය බාර නිලධාරියා වන අබ්දුල් අලි අල්මෙග්‍රාහි නම් ලිබියානු ජාතිකයා බෝම්බ පිපිරවීම සැළසුම් කළ මූලිකයා ලෙස නිවැරදිව හෙළිකරන්නට හැකිවිය. ඒ අනුව එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේද මූලිකත්වයෙන් සැකකරු අල්මෙග්‍රාහි බාරදෙන්නට ලිබියානු නායක මුවම්මර් ගඩාපිට බලකරන ලදි. තමා වෙනට ඉදිරි කාලයේදී පැනවිය හැකි ආර්ථික තහංචි ගැන සිතා ගඩාපි ඉතා අකමැත්තෙන් බෝම්බකරු ස්කොට්ලන්තයට බාර දුන්නේ ය. නඩු විභාගය අවසානයේ මිනිමැරුම් චෝදනා මත අබ්දුල් අල්මෙග්‍රාහිට වසර **27** ක සිර දඬුවමක් ස්කොට්ලන්ත උසාවියෙන් ලැබිණ.

අල්මෙග්‍රාහිට පිළිකාවක් ඇති බවත් ඔහු අසාධ්‍ය තත්වයෙන් පසුවන නිසා මානුෂිකව සලකා ඔහු හිරෙන් මුදාහරින ලෙස නොබෝදා ඉල්ලීමක් කෙරිණ. ඊට අනුකූලතාව දක්වමින් බ්‍රිතාන්‍ය රජය මැදිහත්ව අල්මෙග්‍රාහිව මුදා ලිබියාවට යන්න හැරියේ ය. ලිබියානු රජය ඊට මුවනොසෑහෙනසේ බ්‍රිතාන්‍යයට ස්තුති කළා ය. එහෙත් මෙහි බොහෝ දෙනාද, ඇමරිකාවද ඒ නිදහස්කිරීමට විරුද්ධව බ්‍රිතාන්‍යය රජයට තවමත් දොස් පවරති.

අද එංගලන්තයේ පුවත්පත්වල මුල්පිටුවල සිරස්තල වූයේ ඒ මිනිමරුවා මුදාහැරීමේ පිටුපස ඇත්තේ බ්‍රිතාන්‍යය ලිබියාව සමග ඇති කරගත් තෙල් ගණුදෙනුවක් බවයි. අධිකරණ ඇමති ජැක් ස්ට්‍රෝ කළ ප්‍රකාශයකින් ද ඒ බව හෙළිවිය. පවුම් මිලියන **550** ක මෙම තෙල් ගනුදෙනුව **British Petrolium (BP)** සමාගම වෙනුවෙනි. මානුෂිකව බැලූ හැටි නරක නැත.

# මෙහෙණි සස්න පිහිටවූ බිනර පෝය

**ප**හළොස්වක පොහොය යන් අතුරෙන් වස්සාන කාලයට අයත් බිනර පොහෝදා වඩා වැදගත් වේ. මේ සමය භික්ෂූන් වහන්සේලා භාවනානු යෝගීව ගතකරන කාලයයි. එසේම බිනර පෙහොය වැදගත්වන අනෙක් කරුණ නම් මුල් වරට භික්ෂුණී සාසනය පිටුවන ලද්දේ එම පොහෝ දිනයේ වන බැවිනි.

බුදුසස්න පිහිටවූ මුල් යුගයේ බුදුරජාණන් වහන්සේගෙන් මහණ කම ලද්දේ පිරිමින් පමණකි. කාන්තාවන් මහණවන්නට ඉදිරිපත්වූයේ නැත. මෙසේ තිබියදී සිදුහත් කුමරුන්ගේ සුළු මව වන මහා ප්‍රජාපතී ගෝතමිය සුද්ධෝදන රජතුමා මියගිය පසු තම සියළු කාර්‍යයන් ඉටුකොට අවසාන බැවින් මහණ වෙන්නට සිතුවාය. ඇය බුදුහිමියන් වෙත ගොස් තමාටත් සසුනට ඇතුල් වන්නට අවශ්‍ය බව කීවිට බුදුහාමුදුරුවන් ඇයට පිළිතුරු දුන්නේ " කරුණාකර ඒ ගැන මගෙන් අහන්න එපා" යනුවෙනි.

එහෙත් මහා ප්‍රජාපතී ගෝතමිය ඒ වදනින් අධෛර්‍යයට පත් නොවූවාය. රජමාළිගාවේ සිටි තවත් ශාක්‍යකුල කාන්තාවන් 500 දෙනෙක් ද කඳවාගත්තා ය. ඒ සියල්ලෝ හිස් මුඩුකොට කසාවත් හැඳගත්තෝය. ඉක්බිති පා ගමනින් ම ඒ දිනවල බුදුරජාණන් වහන්සේ වැඩ සිටි ලුම්බිනියෙන් ඉතා ඈත වේසාලි පුරය බලා නික්මුණාහ. එය ඉතා දුෂ්කර ගමනක් විය.

ආරාමය වෙතට පැමිණි ප්‍රජාපතී කෙළින්ම බුදුන් හමුව තමා ඇතුළු කාන්තාවන් ආ කාරණය හෙළි කරන්නට සිතුවේ නැත. යළිත් ප්‍රතික්ෂේප කරාවි යන සැකය නිසා ය. එබැවින් ඇය බුදුන්වහන්සේගේ උවැටන්කරු මෙන්ම, ධර්මභාණ්ඩාගාරිකද වන ආනන්ද හිමියන්ට කරුණු පැහැදිලිකර තමා වෙනුවෙන් කතාකරන ලෙස ඉල්ලා සිටියාය. පැමිණ සිටි කාන්තාවන් පිරිස ඔවුන් ගෙවා ආ දුෂ්කර ගමනේදී කකුල් යටිපතුල් පැරී ලේ ගලමින්ද, ඇඳිවත් කිළිටි වී ඉරුණු ස්වභාවයෙන්ද, විඩාපත් කඳුළු පිරී මුහුණෙන්ද යුක්තව උන් බව දුටු ආනන්ද හාමුදුරුවෝ බුදුන්වහන්සේ වෙත ගොස් ඒ පිරිස වෙනුවෙන් කතාකරමින් ඔවුන්ට සසුනට ඇතුළු වන්නට අවසර දෙන ලෙස ඉල්ලා සිටියහ.

එකල් හි ද බුදුහාමුදුරුවන් දුන් පිළිතුර වූයේ " ආනන්ද..... කරුණාකර ඔය ගැන මට කතා කරන්න එපා....." යන්නයි.

බුදුරජාණන් වහන්සේ විසින් එසේ පවසන ලද්දේ ඇයි දැයි හරි හැටි පැරණි ත්‍රිපිටක දහම් පොත් වල කොතැනකවත් විස්තරකර නොමැති බැවින් එකල වූ සමාජ වට පිටාව ද අනුව යමින් ඊට පිළිතුරක් අපට සකසාගන්නට බැරිකමක් ද නැත.

බුදුහාමුදුරුවන්ට කෙළින්ම තීරණාත්මක වචනයක් එක්වරම දෙන්නට නොහැකි ව්‍යාකූල සමාජ ක්‍රමයක් එකල ඉන්දියාවේ වූයේ ය. එම සමාජ ක්‍රමය දැඩි හින්දු මතිමතාන්තර වැළඳගත් ඒ අනුව හැඩ ගැසුණු එකකි. එහි කාන්තාවන්ට වෙන්කර තිබූ තැන ද උන්වහන්සේ දුටුවේය. දැන් ගන්නා තීරණ අනාගතයේදී කෙබඳුවේදැයි සිතිය යුතු වීය. ඒ තීරණ අනාගතයේදී අපවාද නොඑන ඒවාද විය යුතු වන්නේය.

මහා ප්‍රජාපතිගෝතමිය රජ බිසවකි. එසේම එම මාළිගයේ විසූ අනෙක් කාන්තාවෝ 500 දෙනා ද සැපසම්පත් වලින් පිරී සුඛොපභෝගී ජීවිත ගතකළ අය වෙති. දුක පිළිබඳ වැටහීමක් එවැනි අයට ඇත්ද? භික්ෂුණී ජීවිතය සැප ජීවිතයක් නොවේ. වනයේ ගස් යට ගල් ගුහාවල භාවනාකරමින් අව්වැසි පීඩාවන්ට මුහුණ දෙමින් ජීවිතය ගෙවිය යුතු වන අතර එවැන්නකට

කෙසේ නම් රජමාළිගයක කාන්තාවන් මුහුණ දේද යන්න බුදුන් වහන්සේට ඇතිවන්නට ඇතියයි සිතිය හැකි මූලික ගැටළුවය. එසේම උන්වහන්සේ ප්‍රතික්ෂේප කළේ ඔවුන් කෙරෙහි වූ කරුණාවද පෙරදැරි කරගෙනය.

දෙවැන්න වූයේ, එක්වරම ශාක්‍ය කුලයේ කාන්තාවන් 500 ක් දෙනා මහණ කිරීම ශාක්‍යයන්ගේ උදහසට ලක්වන්නකි. ශාක්‍ය කුලයේ අය තම කුලයේ අය සමග හැර පිටස්තරයින් හා විවාහ නොවෙති. එය නියත වශයෙන්ම ගැටළුවක් වන්නේ ය. ඒ වන විට පිරිමින් මහණ කිරීම ගැනත් පවුල් කඩා කප්පල් කළායයි බුදුහාමුදුරුවන්ට ඇතැම් අයගේ චෝදනා එල්ල වෙමින් තිබුණි. එහෙත් මහණවන්නට කැමැත්තෙන් සිටින ශාක්‍ය කුලකාන්තාවන් බොහෝ දෙනෙකු විවාහක අය වූ අතර ඔවුන්ගේ සැමියන් සියළු දෙනම පාහේ දැනටම මහණ වී සිටින අය බව හෙළිවූ පසු එය ප්‍රශ්නයක් නොවන බව පෙනී ගියේ ය.

ඊළඟට සිතන්නට තිබූ පැත්ත මෙයයි. එක්වර 500 ක් කාන්තාවන් මහණ වූ විට එතරම් විශාල සංඛ්‍යාවකට ගුරු උපදෙස් දෙන්නට, වත් පිළිවෙත් හා කමටහන් කියා දෙන්නට භාවනාව සඳහා පුහුණු කරන්නට සුදුසු උගත්කම හා හැකියාව ඇති ගුරු උපාධ්‍යයන් වහන්සේලා ඒ මොහොතේ පිරිමි බුද්ධ ශ්‍රාවකයින් අතර සිටියේ නැත. බුදු හාමුදුරුවන්ටම තනිවම හැම විටම එම කාර්‍යය ඉටුකරන්නට විවේකයක්ද නොවීය. එයද සිතිය යුතු දෙයක් වීය. පසුව කාන්තාවන්ට ප්‍රව්‍රජ්‍යා භූමියට ඇතුල් වන්නට අවසර ලත් පසුව ද මෙම කාරණය සැබෑවක් බව පෙනී ගියේ ය.

එකල සමාජයේ කාන්තාවන් සසුනේ පැවිදිකරවන්නට බුදුහාමුදුරුවන්ගේ වූ පැකිලීම හා අකමැත්ත ඉහතකී කාරණා වලින් අපට වටහා ගත හැකිය. ඒ ගැන දීර්ඝව සිතා බලන්නට උන්වහන්සේට තව කාලය අවශ්‍ය වීය.

මහා ප්‍රජාපතී ගෝතමී ඇතුළු කාන්තාවන් පිරිස ඒසා මගක් ගෙවා වේසාලි පුරයට පැමිණීම මහණවෙන්නට ඔවුන් තුළවූ සැබෑ උවමනාවෙන් මිස නිකම් හිතුනාට හදිසියේ කළදෙයක් නොවන බව බුදුහාමුදුරුවන්ට පැහැදිලිව වැටහිණ.

මහා ප්‍රජාපතී ගෝතමී ඇතුළු කාන්තාවන් බිනර පුන් පෝදා පැවිදි කරමින් බුදුන් වහන්සේ දේශනා කළේ පිරිමි ගැහැණු දෙපක්ෂයටම නිවන් අවබෝධ කරගැන්මට එක හා සමාන හැකියාවක් තිබෙන බව ය. උන්වහන්සේගේ මෙම ප්‍රකාශනය වඩාත් වැදගත් වන්නේ ප්‍රථම වරට ආගමික ශාස්තෘවරයෙක් ගැහැණු පිරිමි දෙකොටසම අධ්‍යාත්මික වශයෙන් එක සමානව සැලකිය යුතු බව ප්‍රකාශකිරීම නිසා ය.

♦ ***ශ්‍රීමතී වාහලතන්ත්‍රී*** **Devon UK**

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### *හිතෝපදේශයෙන්*

**වලිහිර්මුඛමාක්‍රාන්තං - වලිතෛ: රඤ්ජිතං ශිර:**
**ගාත්‍රානි ශිථිලායන්තෙ - තෘෂ්ණෛකා තරුණායතෙ**

***අර්ථය*** : *මුහුණ රැළියෙන් වළඳනා ලද, හිස නරයෙන් රැඳී ගියේය. හස්තපාදාදී අවයව මස් නැතිව ලිහිල් වන්නාහ. එසේ වුවද පංචකාම ගුණයෙහි තෘෂ්ණාවම තරුණයෙකු මෙන් ගමන් කෙරේ.*

**දි**වා රෑ දෙක්හි මිනිසා පෙළමින්, ඔහුට වේදනා ගෙන දෙන, මිනිස් සිත්සතන් අවුල්කොට, මිනිසුන් නොමිනිසුන් කරන, මිනිස් සිත්හි ගිනි දල්වා ඔවුන් චිත්ත වික්ෂෝපයට පමුණුවන, මිනිසුන් මුළාකොට, සුමග මුවාකොට, ඔවුන් නොමගට පොළඹවන, සසර දිගු මගට යොමුකර කල්ප ගණන් ඔවුන් සසර පුරා ඇවිද්දවන තණ්හාව පිළිබඳ වටිනා දහමක් මෙම පද්‍යයෙන් හෙළිකර ඇත.

මෙහි සඳහන් කාම තණ්හාව උපමා වශයෙන් දක්වන තැනකදී එය සිතට නිතර නිතර වේදනා උපදවන උලක් ලෙසත්, කෙනෙකු තුළ පවතින උතුම් ගුණ දහම් නමැති වස්තුව පැහැර ගන්නා සොරෙකු ලෙසත්, ශාස්ත්‍ර ඉගෙනීම නමැති චන්ද්‍රයාගේ ගමනට රාහු ලෙසත්, සහ තපස් වනය දවා හළුකරන ගිනි කඳක් ලෙසත් උපමාකොට ඇත. ඉන් උගන්වන්නේ මෙම කාම තණ්හාව වරෙක සිතට මහත් වේදනා ගෙනදෙමින් පීඩාකරන බවත්, කෙනෙකු තුළ පවතින ගුණදහම් විනාශකර ඔහු අදැම්ටු වෙකු බවට පත් කරන බවත්, ශිල්පශාස්ත්‍ර හැදෑරීම් ආදී කටයුතුවලට බාධා පමුණුවමින් ඒවා අඩාලකරන බවත්, තවත් වරෙක තවුස්දම් පුරන්නන් එම තවුස්දමින් පිරිහෙලන බවත් යනාදියයි.

බොහෝ දෙනෙකුට මෙම කාම සම්පත් පෙනෙන්නේ ඒකාන්ත යෙන්ම ප්‍රිය ජනක සිත්කලු දේවල් ලෙසය. කාමයන්හි ඇළුණහුට ඉන් මිදීමේ හැඟීමක් ඇතිවන්නේම නැත. තව තවත් ඒවා සොයමින්, දිවා රෑ දෙක්හි වෙහෙසෙමින්, පීඩා කරදර විඳිමින් ඒවා පසුපස හඹා යන බව විමසිලිමත්ව දැකගත හැකිය.

බොහෝ දෙනාගේ එකම ප්‍රාර්ථනාව සහ ජීවිතයේ එකම බලාපොරොත්තුව ඉඳුරන් පිනවීමය. එම ප්‍රාර්ථනාවන් සුන්වූ කල්හි අන්හට දොස් පවරමින්, ශාපකරමින් සමාජයෙන් පලිගැන්මට මාන බලති.

ඉහත දැක්වෙන පද්‍යයෙන් තෘෂ්ණාවේ ස්වභාවය මැනවින් ඉදිරිපත්කොට ඇත. ඉන් පැහැදිලි කරන තවත් දෙයක් නම් නුවණ මුහුකුරා වයසට ගොස් ඉඳුරන් දුර්වල වුවත් තණ්හාවේ වෙනසක් නොවන බවයි. වයසට යත්ම ශාරීරික අවයවයන්, ඉන්ද්‍රියයන් මගින් ඒ බව ප්‍රකටව පෙනෙන්නට පටන් ගනී. යොවුන් වියේදී වූ මට සිළුටු පැහැපත් පිරිසුන් සුන්දර මුහුණ වියපත් වත්ව රැලිවැටෙයි. කළුවන් කෙස් කළඹ, නරකෙස් බවට පෙරළෙයි. අත් පා ආදී අවයවයන්හි පිරිසුන් බව නැති වී, මස්පිඩු දියවී, ලිහිල් ව, කෘශව පෙරවූ රූප සෝබාව සොයාගන්නට බැරි ලෙස අතුරුදහන් වෙයි. මිනිසා කායිකව මෙන්ම මානසිකවද පිරිහුණු කෙනෙකු බවට පත් වෙයි. එහෙත් එසේ කල දවස ගෙවන්නට වන නමුදු ඔහුගේ පස්කම් සැපතට ඇති ආශාව තරුණයෙකුගේ මෙන් දැඩිය.

විශේෂයෙන් කාමය කෙනෙකු අඳ බවට පත්කරමින් තමන් කරන කියන දේ පවා නොපෙනෙන මුළාවූවෙකු බවට ද, කළ යුතු නොකළ යුතු දේ තේරුම්ගත නොහැකි අඥානයෙකු බවටද පත්කරයි. කාමයේ දැඩි බව නිසාම ඔහු මෙලොව අයහපත උදාකරගන්නා අතරම ඊළඟ ආත්මයන්ද දුක්ඛිත ඒවා බවට පත්කර ගනී. නමුත් යමෙක් කාමයන් පිළිබඳව සිහියෙන් කටයුතු කරන්නේ නම්, ඊට මුළා නොවී ඒවා මිනිසුන් මුළාකරන එමෙන්ම කිසි කලෙක ඉඳුරන් තෘප්තිමත් නොකරන මායාවන් පමණක්ම ලෙස අවබෝධ කරගනී.

***රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති***
♦ ***පූජ්‍ය විල්ඔයේ විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue, London W4 1UD**


**NORMA & Co**
**Associate Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**

**Any type of Visa Applications**
**Car Accidents**

***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**